ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.

01. සම්බන්ධ වන ආයතන

1.1	දෙපාර්තමේන්තුව	:	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	
	යොමු අංකය		1/ආ/1/බගැප	දිනය: 2012.05.15
1.2	අමාත්‍යාංශය	:	ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය	
	යොමු අංකය	:	2/5/01/32(II)	දිනය: 2012.09.13
1.3	කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම		යොමු අංකය DMS/G1/18/07 යොමු අංකය DMS/G1/18/07	දිනය: 2012.08.02 දිනය: 2012.09.10
1.4	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය		යොමු අංකය EST-3/RECRU/02/2739	දිනය: 2012.06.22
1.5	ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය		යොමු අංකය NSCC/5/39/1/SR-11	දිනය: 2012.10.05
1.6	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය		යොමු අංකය PSC/EST/6/1/39/7/2013	දිනය: 2013.04.02

02. පත්කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත්කිරීමේ බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ඉඩම් කොමසාරිස් ජනරාල්.

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ප්‍රාථමික ශිල්පීය නොවන

3.2 ශ්‍රේණි : 111, 11, 1 සහ විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයෙහි කාර්යයන් ඉටුකිරීමේදී හා පවත්වා ගැනීමේදී අවශ්‍යවන මූලික පහසුකම් සම්පාදනයට අදාලවන පරිදි ආරක්ෂාව වත්කම් ආරක්ෂා කිරීම මැනුම් කටයුතුවලට සහායවීම,සංචාරක බංගලා පවත්වාගෙන යාම කාර්යාල කළමනාකරණ මට්ටම්වල සහායක සේවා සඳහා අවශ්‍යවන්නාවූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ.මෙම කාර්යයන් අතරින් පත්කිරීම් බලධරයා විසින් පැවරීමට අදාල විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් එම තනතුරට පැවරේ.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : PL 1 – 2006 A

5.2 වැටුප් පරිමාණය : මාසිකව රු. 11730-10X120-10X130-10X145-10X160-17600

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර

ශ්‍රේණිය	ආරම්භක වැටුප් පියවර	ආරම්භක වැටුප් තලය (රු)
III	පියවර 01	රු. 11,730/-
II	පියවර 12	රු. 13,060/-
I	පියවර 22	රු. 14,375/-
විශේෂ	පියවර 32	රු. 15,840/-

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

අනුමත තනතුරු නාමය	තනතුර අනුමත ශ්‍රේණිය	අනුමත තනතුරු සංඛ්‍යාව	කාර්යයන්
කාර්යාල කම්කරු	III II I විශේෂ	15	1. කාර්යාල යතුරු භාරව කටයුතු කිරීම. 2. කාර්යාලය පිරිසිදු කිරීම. 3. ලිපි ලේඛන ගොනුගත කිරීම. 4. ලිපිගොනු මාණ්ඩලික නිලධරයන් හා අනෙකුත් නිලධරයන් වෙත රැගෙන යාම / නැවත ගෙන ඒම.

සංචාරක බංගලා භාරකරු	III II I විශේෂ	05	1. සංචාරක බංගලාවේ භාරකාරීත්වය හා සියළුම දේපල හා වත්කම් ආරක්ෂා කිරීම. 2. සංචාරක බංගලාවේ නැවතීමට පැමිණෙන නිලධරයන් පිළිබඳ කටයුතු කිරීම. 3. අනුමත ගාස්තු අනුව මුදල් අය කර නිසි පරිදි බැංකු ගත කිරීම සඳහා කටයුතු කිරීම. 4. සංචාරක බංගලාවේ ලැගුම් ගැනීමට පැමිණෙන අමුත්තන් වෙනුවෙන් පැමිණීමේ ලේඛණය නිසි පරිදි පවත්වාගෙන යාම. 5. අමුත්තන් සඳහා පැමිණිලි හා යෝජනා සටහන් කිරීමේ ලේඛණය භාරව කටයුතු කිරීම හා ඒ පිළිබඳව නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් දැනුවත් කිරීම. 6. සංචාරක බංගලාව හා ගෙවත්ත පිරිසිදුව තබා ගැනීම. 7. සංචාරක බංගලාවේ කම්කරු ලවා ඔහු වෙත පවරා ඇති රාජකාරී ඉටුකර ගැනීමට කටයුතු කිරීම. 8. ඉඩම් කොමසාරිස් ජනරාල් හෝ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් විසින් පවරනු ලබන රාජකාරී.
සංචාරක බංගලා කම්කරු	III II I විශේෂ	05	1. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් හෝ සංචාරක බංගලා භාරකරුගේ උපදෙස් අනුව කටයුතු කිරීම. 2. සංචාරක බංගලාව හා ගෙවත්ත දර්ශණීය බව රැකෙන පරිදි ක්‍රමාණුකුලව හා පිරිසිදුව පවත්වාගෙන යාම. 3. සංචාරක බංගලා භාරකරුට පවරා ඇති රාජකාරී කටයුතුවලට ඔහුගේ උපදෙස් පරිදි සහාය වීම. 4. නවාතැන් ගැනීමට පැමිණෙන අමුත්තන් සුහදශීලිව පිළිගැනීම හා විනීතව කටයුතු කිරීම. 5. ඉඩම් කොමසාරිස් ජනරාල් හෝ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් විසින් පවරනු ලබන රාජකාරී.

මැනුම් සහයක	III II I විශේෂ	27	1. මිනින්දෝරුවරුන්ගේ මැනුම් කටයුතු වලට සහය වීම. 2. මිනින්දෝරු මහතා සමග ක්ෂේත්‍රයේදී සිදුකරන මැනුම් කටයුතු වලට අදාල උපකරණ නිසි අයුරින් හැසිරවීම, පිරිසිදු කිරීම, ආරක්ෂා කිරීම, අදාල උපකරණ ක්ෂේත්‍ර රැගෙන යාම හා නැවත ගෙන ඒම. 3. ක්ෂේත්‍රයේදී මිනින්දෝරු මහතාගේ නියෝග හා උපදෙස් පිළිපැදීම. 4. ඉඩම් කොමසාරිස් ජනරාල් හෝ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් විසින් පවරනු ලබන රාජකාරී.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

- ❖ කාර්යාල කම්කරු :- 15
- ❖ සංචාරක බංගලා භාරකරු :- 05
- ❖ සංචාරක බංගලා කම්කරු :- 05
- ❖ මැනුම් සහයක :- 27

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා 111, 11, 1 හා විශේෂ ශ්‍රේණින් සියල්ලම ඒකාබද්ධ සේවා ගණයට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා අනුපාතය

ධාරාව	ප්‍රතිශතය
විවෘත	100%
සීමිත	--
කුසලතා	--

7.2 **විවෘත බඳවා ගැනීම**

7.2.1 බඳවාගන්නා ශ්‍රේණිය - 111 ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

7.2.2.3 පලපුරුද්ද : පිළිගත් ආයතනයක සමාන තනතුරක මාස හයක(06)ක පලපුරුද්දක් තිබීම සහතික මගින් සනාථ කල යුතු වේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත වීම.

7.2.2.5 වෙනත් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුයි.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 නොඅඩු

7.2.3.2. උපරිම සීමාව : අවුරුදු 45ට නොවැඩි

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

7.2.4.1. ලිඛිත විභාගය : අදාල නොවේ.

7.2.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.2.4.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය 100%	සමත් ලකුණු ප්‍රමාණය
අතිරේක අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම් වලට අමතර අධ්‍යාපන සුදුසුකම්)	40	අදාළ නොවේ
තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද	30	
තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් ආයතනයක හදාරා ඇති පාඨමාලා හා ලබා ඇති පුහුණුව	25	
සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය	05	

7.2.4.3.1 : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :-

ඉඩම් කොමසාරිස් ජනරාල්

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- අදාල නොවේ

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම : අදාල නොවේ

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාල නොවේ

08. කාර්යක්ෂමතා කඩඉම :

8.1

කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග	කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද	කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලා/ වෙනත්
1 වන කාර්යක්ෂමතා කඩඉම	III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර	වාචික
2 වන කාර්යක්ෂමතා කඩඉම	II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර	වාචික
3 වන කාර්යක්ෂමතා කඩඉම	I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර	ලිඛිත

(විෂය නිර්දේශය ඇමුණුම් 1, 2 හා 3 මගින් දැක්වේ)

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද ?

වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

ඉඩම් කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්.

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

9.1

ශ්‍රේණිය	ලබා ගත යුතු ප්‍රවීණතාවය
01. රාජ්‍ය භාෂාව	රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් බැඳුණු නිලධාරීන් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුලදී ලබා ගත යුතුය.
02. අනෙක් රාජ්‍ය භාෂාව	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගැනීම.

9/15

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 111 පන්තිය සිට 11 පන්තියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :-

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

1. පත්වීම ස්ථිර කර තිබීම.

11. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

111. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක (10)ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

1V. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම.

V1. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.1.1.2 **උසස් කිරීමේ ක්‍රමය :**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 **11 වන ශ්‍රේණියේ සිට 1 ශ්‍රේණියට උසස් කිරීම.**

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව,

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

1. සේවා ගණයේ 11 ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයා ගෙන තිබීම.

11. උසස්වීම් දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

111. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්යසාධන මට්ටමක් පෙන්නුම් කර තිබීම.

1V. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.2.1.2 **උසස් කිරීමේ ක්‍රමය** :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූවිට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 වන ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3 I පන්තියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.3.1.1. **සපුරාලිය යුතු සුදුසුකම් :-**

I. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2 **උසස් කිරීමේ ක්‍රමය :**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සංලක්ෂය

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11. **තනතුරුවලට පත් කිරීම** - අදාල නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි - අදාල නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපනවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන.

❖ සක්‍රිය සේවා කාලය යනු, ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. දැනට සේවයේ යෙදී සිටින්නන් යෝජිත ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම - (ඇමුණුම 04 මගින් දක්වා ඇත)

සකස් කලේ : ....
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

එම්. තිලක් දිසානායක
පරිපාලන නිලධාරී
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
"මිහිකත මැදුර"
ඉඩම් මග ලේකම් කාර්යාලය
1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

නම : එම්. තිලක් දිසානායක
තනතුර : පරිපාලන නිලධාරී
දිනය : 2014.02.17

පරීක්ෂා කලේ : ....
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

I.U. EDIRISINGHE
Deputy Land Commissioner General (Administration)
Land Commissioner General's Department
"Mihikatha Medura"
Land Secretariat
1200/6, Rajamalwatta Road, Battaramulla.

නම : ඩී.එම්.අයි.යූ. එදිරිසිංහ
තනතුර : නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්(පාලන)
දිනය : 2014.02.18

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ....
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ආර්. පී.ආර්. රාජපක්ෂ
තනතුර : ඉඩම් කොමසාරිස් ජනරාල්
නිල මුද්‍රාව :

දිනය : 2014.02.19

යොමු අංකය : 2/5/01/32(1)

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්යාල කම්කරු / සංචාරක බංගලා භාරකරු / [illegible]

තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරිම නිර්දේශ කරමි.

අත්සන : ....

නම :

ලේකම්

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

දිනය : 2014.

නිල මුද්‍රාව :

ඒ. අශෝක පීරිස්
ලේකම්
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය
අංක: 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

යොමු අංකය : PSC/EST/6/1/39/7/2013

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවක සේවා ශ්‍රේණියේ

තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය 2013.04.02 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරමි.

අත්සන : ....

නම :

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014. 03. 31

නිල මුද්‍රාව:

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

ඇමුණුම - 01

<u>විභාග පිලිබඳ ආකෘතිය</u>

01. විභාගයේ නම : ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. සම්මුඛ පරීක්ෂණය පිලිබඳ විස්තරය :

III ශ්‍රේණියට පත්වන අයට වසර තුනක් ඉකුත් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

ඒ ඒ නිලධාරින්ගේ ඒ ඒ පන්තිවලට අදාළ කාර්යාල ක්‍රම විෂය පිළිබඳ දැනුම	=	40
පැමිණීම, වැඩ හා හැසිරීම	=	60
එකතුව	=	100

(සාමාර්ථය සඳහ අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය 40%කි.)

- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අදාළ දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුද, වෙනත් දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරියෙකුගෙන්ද සමන්විත විය යුතුය.
- කාර්යක්ෂමතා කඩඉම පිළිබඳ සහතිකය ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කල යුතුය.
- සේවයේ ස්ථිර කිරීම සඳහා නියමිත කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් විය යුතුය.

03. විභාගය පවත්වනු ලබන නිලධාරියා : ඉඩම් කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග :

වසරකට දෙවරක්

සකස් කලේ : ....

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

එම්. තිලක් දිසානායක
පරිපාලන නිලධාරි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
"මිහිකත මැදුර"
ඉඩම් සහ ලේකම් කාර්යාලය
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

නම : එම්. තිලක් දිසානායක

තනතුර : පරිපාලන නිලධාරි

දිනය : 2014.02. 17

පරීක්ෂා කලේ : ....

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ඊ.එම්.අයි.යූ. එදිරිසිංහ

තනතුර : නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (පාලන)

දිනය : 2014.02.18

E. M. I. U. EDIRISINGHE
Deputy Land Commissioner (Administration)
Land Commissioner General's Department
"Mihikatha Medura"
Land Secretariat
1200/6, Rajamalwatta Road, Battaramulla.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ....

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ආර්. පී.ආර්. රාජපක්ෂ

තනතුර : ඉඩම් කොමසාරිස් ජනරාල්

නිල මුද්‍රාව :

දිනය : 2014.02. 19

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම : ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තරය :

II ශ්‍රේණියට උසස්වන අයට වසර තුනක් ඉකුත් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

ඒ ඒ නිලධාරින්ගේ ඒ ඒ පන්තිවලට අදාළ කාර්යාල ක්‍රම විෂය පිළිබඳ දැනුම.	= 40
පැමිණීම, වැඩ හා හැසිරීම	= 60
එකතුව	= 100

(සාමාර්ථය සඳහ අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය 40%කි.)

- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අදාළ දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරින් දෙදෙනෙකුද, වෙනත් දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරියෙකුගෙන්ද සමන්විත විය යුතුය.
- කාර්යක්ෂමතා කඩඉම පිළිබඳ සහතිකය ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කල යුතුය.
- සේවයේ ස්ථිර කිරීම සඳහා නියමිත කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් විය යුතුය.

03. විභාගය පවත්වනු ලබන නිලධාරියා : ඉඩම් කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

17/18

සකස් කලේ : ....

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : එම්. තිලක් දිසානායක

තනතුර : පරිපාලන නිලධාරි

දිනය : 2014.02. 17

එම්. තිලක් දිසානායක
පරිපාලන නිලධාරි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
"මිහිකත මැදුර"
ඉඩම් මහ ලේකම් කාර්යාලය
1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

පරීක්ෂා කලේ : ....

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ඊ.එම්.අයි.යූ. එදිරිසිංහ

තනතුර : නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (පාලන)

දිනය : 2014.02. 18

E. M. I. U. EDIRISINGHE
Deputy Land Commissioner (Admin)
Land Commissioner General's Department
"Mihikatha Medura"
Land Secretariat
1200/6 Rajamalwatta Road, Battaramulla.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ....

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ආර්. පී.ආර්. රාජපක්ෂ

තනතුර : ඉඩම් කොමසාරිස් ජනරාල්

දිනය : 2014.02. 19

නිල මුද්‍රාව :

විභාග පිළිබඳ අකෘතිය

01. විභාගයේ නම :- ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් ලිඛිත පරීක්ෂණය.

02. විභාගය පිළිබඳ විස්තර I පන්තියට පත් වී වසර 05ක් තුල සමත් විය යුතුය.

ප්‍රශ්ණ පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි	පැය 1	100	40%

03. විභාගය පවත්වනු ලබන නිලධාරියා :- ඉඩම් කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග :- වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශ :-

ප්‍රශ්ණ පත්‍රයේ නම	විෂය නිර්දේශය
ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි	මෙම ප්‍රශ්ණ පත්‍රය පහත සඳහන් ආකාරයට සැකසේ. 01.ප්‍රශ්ණ 50කින් යුතු බහුවරණ ප්‍රශ්ණ පත්‍රයකි. II පරිච්ඡේදය - සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටි සහ පත් කිරීම. IV පරිච්ඡේදය - මාස් පඩි, තාවකාලිකත්වය, ස්ථිරත්වය හා විශ්‍රාම වැටුප් හිමිකම. VII පරිච්ඡේදය - වැටුප් VIII පරිච්ඡේදය - අතිකාල දීමනා,නිවාඩු දින වැටුප් හා දීමනා. XII පරිච්ඡේදය - නිවාඩු XIII පරිච්ඡේදය - දුම්රිය බලපත්‍ර XIV පරිච්ඡේදය - දිවයින ඇතුලත රාජකාරී ගමන්. XVII පරිච්ඡේදය - අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍ර XXV පරිච්ඡේදය - වැටුප් ණය සහ අත්තිකාරම් XLVII පරිච්ඡේදය - රජයේ නිලධාරීන් විසින් සිදුකරන වරදවල් සම්බන්ධ 01 වන හා 02 වන උපලේඛණය සම්බන්ධ දැනුම. මු.රෙ.135,136,138,139 හා 140

සකස් කලේ : ....

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : එම්. තිලක් දිසානායක

තනතුර : පරිපාලන නිලධාරී

දිනය : 2014.02. 17

පරික්ෂා කලේ : ....

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ඊ.එම්.අයි.යූ. එදිරිසිංහ

තනතුර : නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්(පාලන)

දිනය : 2014.02. 18

E. M. I. U EDIRISINGHE
Deputy Land Commissioner (Administration)
Land Commissioner General's Department
"Mihikatha Medura"
1200/6, Rajamalwatta Road, Battaramulla

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ....

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ආර්. පී.ආර්. රාජපක්ෂ

තනතුර : ඉඩම් කොමසාරිස් ජනරාල්

දිනය : 2014.02. 19

නිල මුද්‍රාව :

අන්තර්ග්‍රහණය :-

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළවේ.නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති PL-01-2006-A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහනය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය.එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපි වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකල යුතුය.

(i) PL-01-III ශ්‍රේණිය

(අ) PL-01-2006-A වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්.

(ආ) PL-01-2006-A වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වුවද, II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්

PL-01- III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) PL-01-II ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි PL-01-2006-A වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) කට නොඅඩු එහෙත් අවුරුදු විස්සකට (20) කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්.

(ආ) PL-01-2006-A වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු නවය (09) ක් සම්පූර්ණ වූවද හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්

PL-01- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iii) PL-01- I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු විස්ස (20) කට නොඅඩු එහෙත් අවුරුදු තිහ (30) කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක විස්ස (20) ක් හා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) කට නොඅඩු එහෙත් අවුරුදු දහනවය (19) කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක නවය (9) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ඇ) PL-01-2006-A වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්.

(ඈ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය අවුරුදු නවය (09) ක් සම්පූර්ණ වූවද විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය ඉහත සඳහන් සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්.

PL-01- I ශ්‍රේණියට අන්තර්ග්රහණය කරනු ලැබේ.

(IV) PL-01 විශේෂ ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර තිහ (30) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, එමෙන්ම අදාළ කාලය තුල වැටුප් වර්ධක තිහ (30) ක් උපයාගෙන ඇති නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහනවය (19) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක දහනවය (19) ක් උපයාගෙන ඇති ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ඇ) ඉහත සඳහන් පරිදි I ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු නවය (09) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුල වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන ඇති හා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්.

(ඇ) PL-01-2006-A වැටුප් පරිමාණයේ විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක වැටුප් ලබන නිලධාරීන්.

PL-01- විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සකස් කලේ : ....

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : එම්. තිලක් දිසානායක

තනතුර : පරිපාලන නිලධාරී

දිනය : 2014.02. 17

එම්. තිලක් දිසානායක
පරිපාලන නිලධාරී
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
"මිහිකත මැදුර"
ඉඩම් මග ලේකම් කාර්යාලය
1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

පරීක්ෂා කලේ : ....

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ඊ.එම්.ඈයි.ශු. එදිරිසිංහ

තනතුර : නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (පරිපාලන)

දිනය : 2014.02. 18

E. M. I. G. EDIRISINGHE
Deputy Land Commissioner (Administration)
Land Commissioner General's Department
"Minikatha Medura"
Land Secretariat
1200/6 Rajamalwatta Road, Battaramulla.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ....

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ආර්. පී.ආර්. රාජපක්ෂ

තනතුර : ඉඩම් කොමසාරිස් ජනරාල්

දිනය : 2014.02. 19

නිල මුද්‍රාව :

PSC/EST/6/1/39/7/2013

2/5/01/32(IV)

2016.06.27

ලේකම්

ඉඩම් අමාත්‍යාංශය

<u>**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2008 හි විධි විධාන යටතේ සකස් කරන ලද බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය (කාර්යාල කම්කරු/ සංචාරක බංගලා භාරකරු/ සංචාරක බංගලා කම්කරු/මැනුම් සහායක)**</u>

උක්ත කරුණ සම්බන්ධව ඔබේ සමාංක හා 2016.04.29 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2013.04.02 දින අනුමත කරන ලද ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියට මේ සමඟ ඇති ඇමුණුමේ සඳහන් සංශෝධනයන් එක් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් **2016.06.23** වන දින තීරණය කර ඇති බව එම කොමිෂන් සභාවේ තීරණය පරිදි කාරුණිකව දන්වමි.

එම්.කේ.යූ.එස්.ප්‍රනාන්දු

සහකාර ලේකම් (ආයතන)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ

ලේකම් වෙනුවට

පිටපත්:

1) ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව
2) ආයතන අධ්‍යක්ෂ ජනරාල්
3) ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

CamScanner

සංශෝධන ලැයිස්තුව - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය(PL - 01)

අනු අංකය	ඡේද අංකය	වෙනස් විය යුතු ආකාරය
1.	1.6	යොමු අංකය : PSC/EST/6/1/39/7/2103 දිනය : 2013.04.02 සංශෝධිත දිනය : .... (සංශෝධනය අනුමත කරන දිනය ඇතුළත් කරන්න)
2.	8.1 වගුවේ තුන් වන කාර්යක්ෂමතා කඩඉම පේලියේ 3 වන තීරය	"ලිඛිත" යන්න ඉවත් කර "වාචික" ලෙස සකස් කරන්න
3.	8.3	"ඉඩම් කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්" යන්න ඉවත් කර **"ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්"** ලෙස සකස් කරන්න
4.	ඇමුණුම 01, ඇමුණුම 02, ඇමුණුම 03 හි 03	"ඉඩම් කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්" යන්න ඉවත් කර **"ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින්"** ලෙස සකස් කරන්න
5.	ඇමුණුම 03 හි 02	"විභාගය පිළිබඳ විස්තර I පන්තියට පත් වී වසර 05ක් තුළ සමත් විය යුතුය" යන්න ඉවත් කර **"විභාගය පිළිබඳ විස්තර - වාචික පරීක්ෂණ"** ලෙස සකස් කරන්න 02 වගුවෙහි සඳහන් කරුණු සම්පූර්ණයෙන් ඉවත් කර පහත පරිදි සකස් කර[illegible]

විෂය ක්ෂේත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
කාර්යාල ක්‍රම	මිනිත්තු 15	100	40%

අනු අංකය	ඡේද අංකය	වෙනස් විය යුතු ආකාරය
6.	ඇමුණුම 03 හි 05 වගුව	(පහත වගුව බලන්න)

විෂය ක්ෂේත්‍රය	විෂය නිර්දේශය
කාර්යාල ක්‍රම	පළමු වන හි දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයන්ට අදාළව ගත වූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රය තුළ සිදු වී ඇති පරිපාටිමය, නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයට අදාළ නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා පිළිබඳ මැන බැලීම

ලෙස සකස් කරන්න

CS CamScanner

By Hand

(117)

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700

ලේකම් / செயலாளர் / Secretary: 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305

විද්‍යුත් තැපෑල / மின் - அஞ்சல் / E-mail: sec-psc@sltnet.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/6/1/39/7/2013

ඔබේ අංකය / உமது இல. / Your No.: 2/5/01/32(V)

දිනය / திகதி / Date: 2016.11. 30

ලේකම්

ඉඩම් අමාත්‍යාංශය

190

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි විධිවිධාන යටතේ සකස් කරන ලද බඳවා ගැනීමේ පරිපාටියට "මුරකරු" තනතුර ඇතුළත් කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම

(කාර්යාල කම්කරු/ සංචාරක බංගලා භාරකරු/ සංචාරක බංගලා කම්කරු/මැනුම් සහායක)

උක්ත කරුණ සම්බන්ධව ඔබේ සමාංක හා 2016.09.05 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2013.04.02 දින අනුමත කරන ලද හා අනතුරුව 2016.06.23 දින සංශෝධනය කරන ලද ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියට මේ සමඟ ඇති ඇමුණුමේ සඳහන් සංශෝධනයන් එක් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් **2016.11.24** වන දින තීරණය කර ඇති බව එම කොමිෂන් සභාවේ තීරණය පරිදි කාරුණිකව දන්වමි.

03.තවද, මෙම බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සහතික කර ඇති බැවින් නැවත සහතික කිරීම අවශ්‍ය නොවන බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සිදු කරන ලද සංශෝධනයන් සටහන් කර ගැනීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ආර්.ඩී.පී.එස්.ධර්මසේන

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ

ලේකම් වෙනුවට

පිටපත්:

1) ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
2) ආයතන අධ්‍යක්ෂ ජනරාල්
3) ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

සංශෝධන ලැයිස්තුව - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL - 01)

<table>
<tr><th>අනු අංකය</th><th>විෂය</th><th>සංශෝධනය විය යුතු ආකාරය</th></tr>
<tr><td>1.</td><td>1.3</td><td>යොමු අංකය : DMS/1111 දිනය : 2014.06.10
ඇතුළත් කරන්න</td></tr>
<tr><td>2.</td><td>6.1</td><td><table>
<tr><th>අනුමත තනතුරු නාමය</th><th>තනතුර අනුමත ශ්‍රේණිය</th><th>අනුමත තනතුරු සංඛ්‍යාව</th><th>කාර්යයන්</th></tr>
<tr><td>මුරකරු</td><td>III,II,I, විශේෂ</td><td>16</td><td>ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අයත් සියලුම දේපල හා වත්කම් අරක්ෂා කිරීම හා කාර්යාලයට යන එන අය පිළිබඳව පරීක්ෂාවෙන් සිට අවශ්‍ය විටක පරීක්ෂාවන් සිදු කිරීමටත්, රාජකාරී වේලාව ලෙස පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වාත් ප.ව. 6.00 සිට පෙ.ව. 6.00 දක්වාත් පැය 12ක රාජකාරී ආවරණයක් සිදු කිරීම</td></tr>
</table>
ඇතුළත් කරන්න</td></tr>
<tr><td>3.</td><td>6.2</td><td>මුරකරු :-16
ලෙස ඇතුළත් කරන්න</td></tr>
</table>